# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2032/10 - 2017 අගෝස්තු මස 15 වැනි අඟහරුවාදා - 2017.08.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත

1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 20 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය.

2017 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මෙම නියෝග, 2017 ආනයන බලපත්‍ර හා ප්‍රමිතිකරන සහ තත්ව පාලන නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2013 ජුනි මස 05 වැනි දිනැති අංක 1813/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සහ එහි කලින් කලට සංශෝධනය කරන ලද *ගැසට් පත්‍රයන්හි* පළ කරන ලද විශේෂ ආනයන බලපත්‍ර නියෝගයන්හි අංක 1 දරන උපලේඛනයට මෙහි පහත සඳහන් I සහ II වන තීරයේ දැක්වෙන, අයිතමවල සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ III වන තීරයේ දැක්වෙන, ඊට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| *(I) තීරුව එච් එස් ශීර්ෂය* | *(II) තීරුව එච් එස් කේතය* | | *(III) තීරුව විස්තරය* | *අයි සී එල්* |
|---|---|---|---|---|
| 85.36 | | | වෝල්ට් 1000 නොඉක්මවන රැහැන් පද්ධති සඳහා සම්බන්ධ කෙරෙන (උදා. ස්විච්, රිලේ, ෆියුස්, සර්ජ් සප්‍රෙසර්ස්, ප්ලග්, කෙවෙනි, ලාම්පු රඳවන, සහ වෙනත් සම්බන්ධිකාරක, සන්ධි පෙට්ටි) හෝ විදුලි පද්ධති ආරක්ෂක හෝ මාරුකිරීමේ විදුලි උපකරණ | |
| | | - | ලාම්පු රඳවන, ප්ලග් සහ කෙවෙනි | |




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *(I) තීරුව එච් එස් ශීර්ෂය* | *(II) තීරුව එච් එස් කේතය* | | *(III) තීරුව විස්තරය* | *අයි සී එල්* |
|---|---|---|---|---|
| | 8536.69 | -- | අනෙකුත් | |
| | | | වෝල්ට් 80 ඉක්මවූ නමුත් වෝල්ට් 250 නොඉක්මවූ විභව අන්තරයක් සඳහා | |
| | 8536.69.22 | ---- | වෙනත් කෙවෙනි, විශ්ව කෙවෙනි සහ සංචාරක ඇඩප්ටර (adaptor) | L |
| | 8536.69.29 | ---- | අනෙකුත් | L |
| 85.44 | | | **පරිවාරක වයර, කේබල (කොඇක්ෂියල් කේබලද ඇතුළුව) සහ සම්බන්ධීකාරක සහිත හෝ රහිත වෙනත් පරිවාරක සහිත විදුලි සන්නායක, විදුලි සන්නායක සමග සකස් කළ හෝ සම්බන්ධීකාරක සවිකළ ඔප්ටිකල් ෆයිබර් කේබල්** | |
| | | - | වොල්ට් 1000 නොඉක්මවන වෙනත් විදුලි සන්නායක | |
| | 8544.42 | -- | සම්බන්ධීකාරක සමග සවිකළ ඃ | |
| | | --- | අනෙකුත් | |
| | 8544.42.99 | ---- | අනෙකුත් | L |

3. 2014 ජනවාරි 08 දිනැති අංක 1844/49 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* I වන උපලේඛනය, තවදුරටත් සංශෝධනය කරනු ලැබේ ;

I. 2014 ජනවාරි 08 දිනැති අංක 1844/49 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද, විශේෂ ආනයන (ප්‍රමිතිකරන සහ තත්ව පාලන) රෙගුලාසි සඳහන් අංක II උපලේඛනයෙහි II, I වන තීරුවේ සහ ඊට අදාළ IV තීරුවේ සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක හා අයිතමයන් ඉවත් කරනු ලැබේ.

II.

| *අනුක්‍රමික අංක I තීරුව* | *එච් එස් කේත II තීරුව* | *ද්‍රව්‍යය III තීරුව* | *ශ්‍රී ලංකා ප්‍රමිතිය IV තීරුව* |
|---|---|---|---|
| 75 | 8536.69.10<br>8536.69.90 | ඇම්පියර 5 සහ ඇම්පියර 15 කුරු තුනක් සහිත පේනු, කෙවෙනි සහ කෙවෙනි ඇඩප්ටර් | කුරු තුනක් සහිත පේනු, කෙවෙනි සහ කෙවෙනි ඇඩප්ටර (adaptor) සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති 948 පිරිවිතර |
| 76 | 8536.69.10<br>8536.69.90 | ඇම්පියර 13 පුළුසු සහිත පේනු, ස්වීච සහ ස්වීච රහිත කෙවෙනි ඇඩප්ටර් | ඇම්පියර 13 පුළුසු සහිත පේනු, ස්වීච සහ ස්වීච රහිත කෙවෙනි ඇඩප්ටර (adaptor) සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති 734 පිරිවිතර |

III. 2014 ජනවාරි 08 දිනැති අංක 1844/49 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද, විශේෂ ආනයන (ප්‍රමිතිකරන සහ තත්ව පාලන) රෙගුලාසි සඳහන් අංක II උපලේඛනයෙහි III වන තීරුවේ සහ ඊට අදාළ IV තීරුවේ සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක හා අයිතමයන් ඇතුළත් කරනු ලැබේ.

| *I තීරුව අනුක්‍රමික අංකය* | *II තීරුව එච් එස් කේත* | *III තීරුව විස්තරය* | *IV තීරුව ශ්‍රී ලංකා ප්‍රමිතිය* |
|---|---|---|---|
| 75 | 8536.69.21 | ජාත්‍යන්තර විද්‍යුත් තාක්ෂණ කොමිසම (IEC) විසින් නිර්වචනය කරන ලද ජී වර්ගයේ ඇම්පියර 13 පේනු සහ කෙවෙනි - පිටවාන්, විදුලි මෝටර් රථ ආරෝපනය සඳහා වන පේනු සහ කෙවෙනි ඇතුළත්ව, කෙවෙනි පිටවාන්, බහු කෙවෙනි, ඇඩප්ටර්ස්, විලායික සහිත සම්බන්ධීකාරක ඒකක සහ විලායික සහිත පරිවර්ථක පේනු ආදිය | ඇම්පියර 13 පේනු, කෙවෙනි පිටවාන් සහ ඇඩප්ටර් සහ සම්බන්ධිකාරක ඒකක සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති 734 පිරිවිතර |
| 76 | 8544.42.91 | කේබල දිගු/අතේ ගෙන යා හැකි කෙවෙනි පිටවාන් | ඇම්පියර 13 පේනු, කෙවෙනි පිටවාන් සහ ඇඩප්ටර් සහ සම්බන්ධිකාරක ඒකක සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති 734 පිරිවිතර |
| 124 | 8544.42.91<br><br>8544.49.20<br>8544.49.30 | ජාත්‍යන්තර විද්‍යුත් තාක්ෂණ කොමිසම (IEC) විසින් නිර්වචනය කරන ලද ජී වර්ගයේ ඇම්පියර 13 පේනු සහ කෙවෙනි - පිටවාන් සමග සවිකර ඇති සම්බන්ධීකාරක සහිත කේබල් රීල් | ගෘහස්ත හා සමාන අරමුණු සඳහා වූ කේබල් රීල් ශ්‍රී ලංකා ප්‍රමිති 1532 |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.